සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 13 - 2026

71 S I

## සිංහල - I

කාලය පැය 03 යි
අමතර කාලය වි. 10යි

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

---

(01) පහත දැක්වෙන (අ) , (ආ) , (ඉ) , (ඊ) සහ (උ) උද්ධෘත අතරින් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ව්‍යවහාරය ම යොදාගන්න.

(අ) නුවර මුළුල්ල අසුරන් වැදගිය දිව්‍යපුරයක් මෙන් ඇළලී දෙ පක්ෂයේ කථා අසම්හයි නුවරවැස්සෝ පරිව්‍රාජිකාවන් හා කැටිව ම ගොසින් මහතෙරුන්වහන්සේ වැඳලා එකත්පස් ව හුන්හ. පරිව්‍රාජිකාවෝ මහතෙරුන්වහන්සේට 'ප්‍රශ්නයක් විචාරම්හ' යි කිවූය. 'තබන්නේ කවර දවසකට ද? විචාරව'යි වදාළ සේක. ඌ තමන් උගත් වාද දහස ම විචාළෝ ය. මහතෙරුන්වහන්සේ විසඳාලූ සේක. විසඳා නිමවාලා 'තොප විචාරන ප්‍රශ්න මෙතෙක් ද? තවත් ඇත්ම දැ'යි විචාළසේක. උගත් වාද එතෙක් ම හෙයිනුත් එම පිරිමසා ඇවිදි පමණක් මුත් ඔබ්බෙන් උගත් දෙයක් නැති හෙයිනුත් පුරාතනයන් සිතා උපදවාලූවා තමන් සිතාගෙන කියාලන්ට බල නැති හෙයිනුත් 'එතෙකැ'යි කිවූය. 'තොපි අප අතින් බොහෝ ප්‍රශ්න විචාළා වේ ද? අපිත් ඒ විසඳා කීමෝ වේ ද? තොප අතින් අපි බොහෝ කොට නොවිචාරම්හ. එක සුගක් විචාරම්හ'යි ඒ කියවූ දැ'යි විචාළ සේක. 'විචාළමැනව, ස්වාමීනි' යි කිවූය. 'වදාළ එකක් විචාරම්හ'යි කී හෙයින් එම අල්වාගෙන 'එකෙක් නම් කිම් දැ'යි විචාළසේක.

i. මුළු නගරය ම අසුරයන් කඩා වැදුණු දෙව් ලොවක් මෙන් කැළඹී ගියේ ඇයි?

ii. මහ තෙරුන් වහන්සේ ජම්බු පිරිවැජිනියගෙන් විමසූ පැනය කුමක් ද?

iii. 'තබන්නේ කවර දවසකට ද?' මෙය ලිහිල් බසින් ලියන්න.

iv. 'පරිව්‍රාජිකාව' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 1 × 4 = 04)

(ආ) මෙසේ වැඩෙන්නා වූ ඒ ජීවකයන් සත් අට හැවිරිදි වූ කල කෙළිමඬලෙහි සෙසු රජ කුමරුවෝ "මවුන් නැත්තව" යි කිය කියා බැණ බැණ කෙළිති. එකල ජීවකයෝ ලජ්ජා ඇතිව අභය රජකුමාරයන් කරා පලා ගොස් "ස්වාමීනි, මා වැදූවෝ කවුරුදැයි" විචාළහ. එකල රාජකුමාරයෝ මඳක් සී "තොප පියාණෝ නම් මමය. තොප මවුන් කා බවක් නොදනිමි. තොප වල දමාපියා ඔත් තැන දැන වඩා ගතිමි" යි කීය. එතැන් පටන් ජීවකයෝ තමන් වූ පවත් දැන "මාගේ කිසි නෑසිය කෙනෙකුත් නැත. මතු මට හිමි වන කුල සැපතෙකුදු නැත. එසේ හෙයින් මා විසින් ශිල්පයක් හදාරා ගත මැනව." කෙසේ වූ ශිල්පයක් හදාරම් දෝ හෝ" යි නිරවද්‍ය වූ ශිල්ප පරීක්ෂා කරන්නාහු "අෂ්ටාදස ශිල්ප සූසැට කලා ශිල්පයෙන් සෙසු ශිල්ප පරපීඩා පරහිංසා මිශ්‍රය.

i. ජීවක කුමරු ලජ්ජාවට පත්වීමට හේතුව කුමක් ද?

ii. ජීවක කුමරු ශිල්පයක් හැදෑරීමට තීරණය කළේ ඇයි?

iii. "අෂ්ටාදස ශිල්ප සූසැට කලා ශිල්පයන්" මෙය ලිහිල් බසින් ලියන්න.

iv. "පරපීඩා" යන්නට කෙටි විවරණ දෙන්න.

(ලකුණු 1 × 4 = 04)

Scanned with TapScanner

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ඉ) "එවිට ශක්‍රයෝ කියන්නාහු" තොප මට සිනාසෙන්ට කාරණා කිම් ද? තොපගේ පළමු පිසවා කෑ සමුණනුත් නැති ව අලුත් සමුණනුත් නැති ව උභය භ්‍රෂ්ට ව ඉඳිනා තෙපි මට නින්දා කියා සිනාසෙන්නෝ ය." යි ශක්‍රයෝ නින්දා කොට බිණුහ. ඊට ස්ත්‍රිය කියන්නී "පළමු මෙසේ වූ නොකටයුත්ත කොට මෙසේ වූ දුකකට පැමිණියෙමි. ඉතිබ්බේ පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ දෙයක් නො කරමි" කිව. ශක්‍රයෝත් "පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ නොකටයුත්තක් නොකරව"යි කියා අවවාද දී දෙව්ලොවට ගියාහ. " යි වදාරා සර්වඥයන් වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ චුල්ලධනුද්ධර ජාතකය නිමවා වදාළ සේක.

i. ශක්‍ර දේවේන්ද්‍රයා පවසන ස්ත්‍රියගේ දෝෂය කුමක් ද?

ii. ස්ත්‍රියට ශක්‍ර දේවේන්ද්‍රයා ලබා දුන් ධර්මෝපදේශය කුමක් ද?

iii. "උභය භ්‍රෂ්ටව හිඳිනා තෙපි" මෙය ලිහිල් බසින් ලියන්න.

iv. "පතිව්‍රතා ධර්මය" යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 1 × 4 = 04)

(ඊ) කෙළවර ඒ මරණ නමැති මෘත්‍යුමාරයා හා යුධ කරන්නාවූ ස්ථානය ඇතුන් අසුන් රථ පාබල සෙනඟ ගෙන යුධ කිරීමට භූමියකුත් නොවෙයි, එසේ හෙයින් යුද්ධයෙනුත් ජය ගත නොහැක්ක. අන් කිසි මන්ත්‍ර ප්‍රයෝග ඖෂධ ප්‍රයෝග ආදියෙන් ද ධනධාන්‍යාදි වස්තු දී සිත් ගැන්මෙන් ද යන කිසි ප්‍රයෝගයකිනුත් මෘත්‍යුමාරයා ජය ගත නොහැක්ක. මරණ නම් අද ය සෙට ය යි දැන ගත නොහැක්ක. ඒ නියමයෙක් නැත. සියල්ලවුන්ට ම මරණ ඒකාන්ත ව පවතිමින් සිටිය දී යමෙක් මරණ අද ය සෙට ය යි නියම නැති බව තමාගේ නුවණින් පරීක්‍ෂා කරන්නේ වී නම් ඔහට හාසයෙක් වේව යි සන්තොෂයෙක් වේව යි කිසිවෙක ඇල්මෙක් වේව යි වස්තු සෙවීමෙක් වේව යි සෙඳු දෑ තබා බතක් පැනක් කන්නට බොන්නට වත් අභිප්‍රාය නොවන්නේ ම ය යි" කීහ. මෙසේ ඒ වෙළෙඳාණන්ගේ භාර්‍ය්‍යාවෝ නොයෙක් කාරණයෙන් තමන් කැඳවා ආ කෙල්ල ගිවිස්සා නික්මවූහ. ඉක්බිති ඒ අමාත්‍යයා තමාගේ කෙල්ල අතින් එපවත් අසා ඒ බසටත් නොපසුබැස සාරදහසක් දී එම කෙල්ල නික්මවී ය. එකල වෙළෙඳාණන්ගේ භාර්‍ය්‍යාවෝ තුන් වන වාරයෙහි ආ කෙල්ල දැක "එම්බා නැඟණියෙනි, මේ අනුන් සන්තක වස්තුවෙහි වරදවා පිළිපදනේ ය යි තොපගේ අමාත්‍යයාණන්ටත් නුගුණ ය, මෝ තොමෝ තමාගේ ගේහිමියා ඉක්ම පවත්නී ය යි මටත් නින්දා වන්නේ ය...

i. යුධ වැදීමෙන් ජයගත නොහැක්කේ කවරෙකු ද?

ii. නන්දිය වෙළෙඳාණන්ගේ භාර්යාව නින්දාවට පත්වීමට හේතුවක් ලෙස හිතන්නේ කුමක් ද?

iii. "මන්ත්‍ර ප්‍රයෝග ඖෂධ ප්‍රයෝග ආදියෙන්" මෙය ලිහිල් බසින් ලියන්න.

iv. "හාසයෙක්" යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 1 × 4 = 04)

(උ)

| | |
|---|---|
| සුරසෙන් ගෙන සැදි සුදම් | සබාවට |
| සතොසින් පැමිණෙන සුරිඳු | සුබාවට |
| අවසන් නොව දිලි රුවන් | පබාවට |
| රජසෙන් සහ රජ පිවිස | සබාවට |

| | |
|---|---|
| පලන් අබරණ | දෝ |
| චතුරෙන් සබය කැරැ | දෝ |
| ලොව පරසිඳු | සොඳෝ |
| උන්තු සුවහස් ගණන් | නිරිඳෝ |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned with TapScanner

1. රජු සභාවට සම්ප්‍රාප්ත වූයේ කවරාකාරයෙන් ද?
2. සභාව ඩෝවනය වන්නේ කුමකින් ද?
3. ''උන්නු සුවහස් ගණන් නිරිඳෝ'' මෙය ලිහිල් බසින් ලියන්න.
4. ''රුවන් පබා'' යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 1 × 4 = 04)

- (ඍ) සහ (එ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(ඍ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක් අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. ''සැබෑ ද මහණ තා ස්ත්‍රියක කෙරේ ලෝභයෙන් වාසය කරන්නේ ද?''
ii. ''මාගේ ශාස්ත්‍රබල දක්වා මුත් කිසිවක් නොගන්මි.''
iii. ''එදවස් මරන්ට ගෙන යන නියාව දැක දෙමව්පියන්ට කීමි.''
iv. ''මාගේ ගෙහිමියාණෝ ඒකාන්තයෙන් ම නැත්නම් එදවස් දන්නේම් වේද?''
v. ''මං ආපසු ගෙදර එන්ඩ ඕනෑ අප්පොච්චි.''
vi. ''හොඳට හිතා ගන්නවා, අහන දේට විතරක් උත්තර දෙනව.''
vii. ''මා යවන්නට කැමති ද ඔබ නිරතුරු ඇවටිලි කරන්නේ?''

(ලකුණු 3 × 4 = 12)

(එ) වස්තු විෂය හා කාව්‍ය භාෂාව කෙරෙහි අවධානය යොමු කරමින් පහත පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**තවමත් ඔබ මගේය**

සිහිලැල් සිනාවට උණු කඳුළ්    නැවුණා
කඳුළෙහි සියුම් දහමෙක රසය    ගැවුණා
උස් කඳු මුදුන් ගන මීදුමක    පා වුණා
අරුණාලෝකයක් ඇඳිරියට    යා වුණා

කළු ගල් පවා වන මල් පෙති මෙන් මුදු    වේ
දවසෙක එහෙත් මල් පෙති කළු ගල් බඳු    වේ
ලුහුබැඳ ගමන් ගත් අදහස් ඈත    පොදුවේ
සිතු දෙය නොසිදු වේ නොසිතුව දෙය සිදු    වේ

හෙල් තැනිතලාවල උඳුවප් දුරුතු    මහේ
ලස්සන දැකුම්කලු දේ අද බැලිය    නොහේ
හිරිමල් හලන්නට ගඟ බඩ ඇටඹ    ගහේ
මින් පසු නො ඒවා සීතල සුළඟ    මෙහේ

උස් කඳු මුදුන්වල වැජඹෙන    සිරිමලිය
ඔබගෙන් අලුත් දහමක් මට    පැහැදිලිය
රුමත් මුහුණකට ඇති මිහිරි ම    එළිය
සිහිලැල් සිනා රැළි නොව උණු    කඳුළැලිය

රහසක් අනුව ඔබ හදවත ඔබට    නොකී
මා ගැන අඳුරු සෙවණැලි හැම තැන ම    දකී
පිය සටහන් ඇතත් කඳු හෙල් අතර    මැකී
ගී හඬ ඔබට වා මඬලින් ඇසිය    හැකී

කඳු බෑවුමේ දිය වැල් ගල් කුලෙක    හැපී
වෙන් වී ගලාගෙන ගොස් දෙකඩකට    කැපී
නැවතත් එකතු වන මෙන් පෙණ බුබුළ්    පිපී
කවදා කොතැනකදි හෝ මුණගැහෙමු    අපී

Scanned with TapScanner

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

දේදුනු . -වලාකුළු කඳුගැට දකින  තුරු
බොල් පිනි පොකුරු . හිරිකඩ වැසි වැටෙන  තුරු
මීදුම ගලන තුරු, වන මල් පිපෙන  තුරු
ඔබ අමතක නො වේ කළු ගඟ ගලන  තුරු

මුළු ලොව කිසිවකුට කිසි දවසකදි  මතු
රහසක් නො වේවා! යට ගිය යුගයෙ  තතු
ඔබගේ හේළි කිවි මැඳුරෙහි දවල  බිතු
තිබුණා වගේමයි වෙනසක් නොවිය  යුතු

සැඟවුණු ගිනි පුපුරු අළු යට තිවේ  නම්
ඊ මත අලුත් සිසිලක් කිති කැවේ  නම්
මේ දිවි ගමන කෙටි මඟකට ගෙවේ  නම්
හමු වනුවට අගෙයි, යළි යමු නොවේ  නම්

(ලකුණු 12)

(02)
(අ) ධර්මසේන හිමියෝ කතාව රසවත් ව ඉදිරිපත් කරන අතර ම චරිත නිරූපණයේ දී මානව දයාව ද අමතක නොකරති. නියමිත කතා වස්තු ඇසුරින් උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
(ලකුණු 15)

<u>නැතහොත්</u>

(ආ) කතා වස්තු පැරණි වන නමුත් ජාතක කතා, නූතන පවුල් සංස්ථාවට ද ගැඹුරු ජීවිතාදර්ශ සපයන අයුරු නියමිත කතා වස්තු ඇසුරින් පෙන්වා දෙන්න.
(ලකුණු 15)

(03) සාරධර්ම සුපෝෂණය සමකාලීන උපදෙස් ලබාදීම සද්ධර්මාලංකාරයේ අරමුණයි. නියමිත කතා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

<u>නැතහොත්</u>

විස්මය ජනක සිදුවීම් ආශ්‍රිතව දන්දීමේ අනුසස් පෙන්වා දෙමින් ජනීජනයා දානමය කුසල කර්මයන්ට නැඹුරු කිරීමේ ප්‍රවණතාවන් අනුරුද්ධ කතා වස්තුවෙන් ප්‍රකට වේ. සනිදර්ශිතව පැහැදිලි කරන්න.
(ලකුණු 15)

(04) (අ) කෝට්ටේ යුගයේ ප්‍රසිද්ධ අධ්‍යාපන ආයතන හා පඬිවරුන් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
(ලකුණු 07)

(ආ) වැත්තෑවේ හිමියන් මූසිල චරිතය සරල චරිතයක් ලෙස නොව සංකීර්ණ චරිතයක් ලෙස කාව්‍යාත්මකව නිරූපණය කර ඇත. නියමිත උදාහරණ ඇසුරින් සනාථ කරන්න.
(ලකුණු 08)

(05) බැද්දේගම කතුවරයා පාඨක සිත්සතන් මානව සහකම්පනයෙන් පුරවාලමින් අවස්ථා සිද්ධි නිරූපණයෙහිලා සමත්වී ඇති අයුරු පැහැදිලි කරන්න.
(ලකුණු 15)

(06) මධ්‍යම පාන්තික සමාජයේ ඇතැම් මිනිසුන්ගේ හදවත් තුළ කැකෑරෙන පීඩිත පංතිය පිළිබඳ විරෝධතාව අකුරට යන වෙලාවේ කෙටිකතාවෙන් මනාව විවරණය කර ඇත. පැහැදිලි කරන්න.
(ලකුණු 15)

(07) පද්‍ය නිර්මාණයේ දී එහි අන්තර්ගතය සේම සිය අත්දැකීම් ප්‍රකාශයට උචිත බස්වහරක් යොදා ගැනීම නිර්මාණකරණයේ සාර්ථකත්වයට හේතුවේ. නියමිත පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 15)

(08) එදිරිවීර සරච්චන්ද්‍රයෝ චිත්ත අභ්‍යන්තර මනෝභාවයන් උද්දීපනයට සමත් නිර්මාණාත්මක කවි බසක් ස්වකීය නිර්මාණය සඳහා උපයුක්ත කර ගනිති. ''පෙමතෝ ජායතී සෝකෝ'' නාට්‍ය ඇසුරෙන් විමසන්න.
(ලකුණු 15)

PAST PAPERS WIKI